ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය Business & Accounting Studies

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය
Business & Accounting Studies

| 60 | S | I, II |
|---|---|---|

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) තරග විභාගය 2013 ජූලි
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை,2013 ஜூலி
Genaral Certificate of Education (Ord. Level) Examination, July 2013

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I, II
வணிகக் கல்வியும் கணக்கீடும் I, II
**Business and Accounting Studies I, II**

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය II

- ❖ පළමුවන ප්‍රශ්ණය ඇතුලු සියලුම ප්‍රශ්ණ වලට පිළිතුරු සපයන්න.
- ❖ පිළිතුරු පැහැදිලි අත් අකුරින් ලියන්න.

01. නුගේගොඩ විජේරාම ප්‍රදේශයේ ජීවත්වන ශෙනාල් මෙවර උසස් පෙළ හදාර සිටින තරුණයෙකි. ඔහු තම මිතුරන් වන හංස හා ජීවක සමග එකතුව ව්‍යාපාරයක් ඇරඹීමට අදහස් කරයි. ඔවුන් අතර ඇති වු සාකච්ජාවක් පහත වේ.

ශෙනාල් : මගේ බැංකු පොතේ රු. 300,000ක් තියෙනවා. මං හිතන් ඉන්නේ ඒකෙන් හොඳ ව්‍යාපාරයක් අරඹන්න.

හංස : ඔව් ශෙනාල් ඒක හොඳයි. විජේරාම හංදියේ අපේ කඩ කාමරේ අපිට ව්‍යාපාරයක් පටන් ගන්න පුලුවන්. ඒත් අපි මොනවද කරන්නේ...

ජීවක : කැම්පස් එකත් ලග නිසා Book Shop එකක් දැම්මොත් හොඳ නැද්ද ?

ශෙනාල් : ඔව් ඒක හොඳයි. අපි "සංහිඳ" කියලා නම දාමු ද ?

හංස : අපිට බැංකු ණයකුත් ගන්න පුලුවන්නේ... වගකීම සීමිත ව්‍යාපාරයක් නම් වැඩිය හොඳයි නේද?

ජීවක : ඔව්. ඒක හොඳියි..

මෙම සාකච්ජාවෙන් පසු ශෙනාල්, හංස හා ජීවක පිළිවෙලින් රු. 300,000, රු. 50,000 ක් හා රු. 250,000ක් හා හංස තමා සතු රු. 150,000 ක් වටිනා කඩ කාමරයද යොදාගෙන ව්‍යාපාරය ආරම්භ කරන ලදි.

ඔවුන් රු. 100,000 ක බැංකු ණයක් ලබා ගත් අතර ෆොටෝ කොපි යන්ත්‍ර 2ක් එකක් රු. 60,000 බැගින් මුදලට ගන්නා ලදි.
තවද තම මිතුරෙකු වු අමිලගෙන් පොත් රාක්ක 3ක් රු. 30,000කට ණයට ලබා ගන්නා ලදි.

ඔවුන් ව්‍යාපාරයේ පළමු වසර තුළ රු. 350,000 ක වටිනා විකුණුම් කර තිබු අතර රු. 175,000 ක් ගැණුම් කර තිබුණි. විදුලි වියදම් 15,000ක් වු අතර දුරකථන බිල රු. 10,500 ක් විය. විශේෂයෙන් සදහන් කොට නැත්නම් සියලු ගනුදෙනු මුදලින් බව සලකා පහත ප්‍රශ්ණ වලට පිළිතුරු සපයන්න.

01. ඔබ සිතන ආකාරයට මොවුන්ගේ අභිප්‍රායට අනුව ගැලපෙන ව්‍යාපාර සංවිධානය කුමක්ද ?
02. මෙම ව්‍යාපාරය ලියාපදිංචි කළ යුතුද ? කල යුතු නම් කුමන පනතක් යටතේ ද?
03. මෙම ව්‍යාපාරය නම් කිරීමේ දී විශේෂයෙන් සදහන් කළ යුතු පද ඇතොත් ඒවා නම් කරන්න.
04. ඔබ සිතන ආකාරයට මොවුන්ට ගැලපෙන තවත් ව්‍යාපාර අවස්ථා 02ක් දක්වන්න.
05. මෙම ව්‍යාපාරය ආරම්භයට පෙර ඔවුන් සකස් කල යුත්තේ කුමක් ද? එහි මූලිකාංග මොනවාද ?
06. මෙම ව්‍යාපාරයට බලපෑම් කළ හැකි බාහිර පරිසර සාධක මොනවා ද?
07. මෙම ව්‍යාපාරය සම්බන්ධයෙන් වඩා සුදුසු බෙදාහැරීම් මාර්ග 2ක් දක්වන්න.
08. මෙම ව්‍යාපාරයේ ආරම්භක ප්‍රාග්ධනය කොපමණ ද?
09. මෙම ව්‍යාපාරයේ බාහිර වගකිම් ප්‍රමාණය කොපමණද?
10. ව්‍යාපාරයේ වර්ෂ අවසානයේ ලාභය කොපමණද ?

*(ලකුණු 02 x 10 = 20 යි)*

## I **කොටස - ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය**

(ප්‍රශ්ණ **සියල්ලට ම** පිළිතුරු සපයන්න.)

02. (i) බාහිර පරිසරය තුළින් හඳුනා ගත් තර්ජන 4ක් නම් කරන්න.

(ii) ළමා ජනගහනය ඉහල යාම තුළින් බිහිවිය හැකි ව්‍යාපාර අවස්ථා 2ක් නම් කරන්න.

(iii) ප්‍රාථමික නිෂ්පාදනය බෙදෙන මූලික කොටස් මොනවා ද?

**(iv)** ණයපතක් (**Credit Card**) භාවිත කිරීමෙන් පාරිභෝගිකයෙකුට ලැබෙන අවාසි 2ක් නම් කරන්න.

**(v)** ඉතිරිකිරීමේ ගිණුමකට සාපේක්ෂව ස්ථාවර තැන්පත් වල ආයෝජනය කිරීම තුළින් ලැබෙන වාසි 2ක් ලියන්න.

(ලකුණු 02 **x** 05 = 10 යි)

03. **(i)** අරමුණ අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කරන ගැලීම් සටහන ඇඳ දක්වන්න.

**(ii)** කාරක ප්‍රාග්ධනය යනු කුමක් ද?

**(iii)** ව්‍යාපාරයක් විසින් සකස් කොට ඉදිරිපත් කළ යුතු මූල්‍ය ප්‍රකාශ 3 නම් කරන්න.

(iv) ව්‍යාපාර සැලැස්මක් සකස් කිරීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු 4ක් නම් කරන්න.

(v) වෙළෙඳ පොළක පාරිභෝගිකයාගේ හැසිරීම හොඳින් වටහා ගත හැකි W5 රාමුව නම් කරන්න.

(ලකුණු 02 **x** 05 = 10 යි)

## II **කොටස - ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය**

(ප්‍රශ්ණ **සියල්ලට ම** පිළිතුරු සපයන්න.)

04. I. නිෂ්පාදන පිරිවැය පිළිබඳව දැන සිටීමෙන් නිෂ්පාදන ආයතනයකට ප්‍රයෝජනවත් වන කරුණු 2ක් නම් කරන්න.

(ලකුණු 02 යි)

II. මධු සිරිවර්ධන 3 අවුරුදු සැළැස්මකට අනුව ව්‍යාපාරයක් කරගෙන යනු ලැබේ. 2014, 2015 හා 2016 වර්ෂ සඳහා සකස් කරන ලද සැලැස්මේ අළෙවි කිරීමට අපේක්ෂිත නිෂ්පාදනය පිළිබඳ ලබා ගත් තොරතුරු පහත දැක්වේ.

- ❖ පිළිවෙලින් ඒකක 5000, 7000 හා 9000 බැගින් ඉදිරි වර්ෂ සඳහා අළෙවි කළ හැකි බව
- ❖ විකුණුම් මිල ඒකකයකට 2016 වර්ෂයේ රු. 20ක් වන අතර රු. 5 බැගින් පසු වර්ෂ සඳහා අඩු වේ.
- ❖ මාසික වියදම 2014 වර්ෂයට ඒකකයකට රු. 8/- වන අතර එය රු. 2/- බැගින් වාර්ෂිකව වැඩි වේ.

ඉහත දත්ත ආධාරයෙන් තුන් අවුරුදු අළෙවි සැලැස්මක් පිළියෙල කරන්න.

(ලකුණු 08 යි)

(මුලු ලකුණු 10 යි)

05. (i) වාණිජ බැංකුවක් සලසන සේවා 4ක් නම් කරන්න.

(ii) අනේවාසික විදේශ මුදල් ගිණුමක් යනු කුමක් ද?

(iii) නාලක පෙරේරා වත්තල සෙලාන් බැංකුවේ 229 90 2290 8 දරණ ජංගම ගිණුම් හිමිකරු වේ. මහජන බැංකුව (සංකේත අංකය 7135) කොටිකාවත්ත (සංකේත අංකය) 098 ශාඛාවේ ගිණුම් අංක 108 00 3289 1 ගිණුම් හිමියෙකු වන අවිනි සියඹලාගොඩ රු. 6,600 ක් වටිනා බඩු තොගයක් නාලක පෙරේරාගෙන් මිලට ගෙන ඒ සඳහා 223211 දරණ චෙක්පත 22.07.2013 දින උපරිම ආරක්ෂාවක් සැලසෙන අයුරින් රේඛණය කර නිකුත් කරන ලදි.

මෙම දත්ත ආධාරයෙන් චෙක්පතක දළ ආකෘතියක් ඇඳ දක්වන්න.